
# සොබාදහමේ අරුමය



එන්.ඩබ්.එම්. හයන්ෂා ගයින්දි නවරත්න

4 ශ්‍රේණිය B
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

# සොබාදහමේ අරුමය

**එන්.ඩබ්.එම්. හයන්ෂා ගයින්දි නවරත්න**

**කතෘ**

**කතෘගේ වෙනත් කතෘ**

**පුංචි සුරංගනාවිය**

**හා පැංචාගේ පාසල් නිවාඩු කාලේ**

**මහමායා බාලිකා විද්‍යාලය**

**4 ශ්‍රේණිය බී**

**2026.04.20**

## පිදුම

මාගේ ආදරණීය චම්පිකා කුමාරි ගුරු මෑණියන්ට සහ මාගේ

ආදරණීය අම්මා හා අප්පච්චිට



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## ස්තූතිය

නැමති කතාන්දර පොත නිර්මාණය කිරීමට මඟ පෙන්වූ මාගේ පන්තිභාර ගුරුතුමිය වන 4-බී ශ්‍රේණියේ චම්පිකා ගුරු මෑණියන්ටත්,

මාගේ ආදර අම්මි හා අප්පච්චිටත්, අයියා හා අක්කාටත් නන් අයුරින් උදව් කළ සොනාලි නැන්දටත් මාගේ හදපිරි ස්තූතිය පුදකරමි.

එන්.ඩබ්.එම්. හයන්ෂා ගයින්දි නවරත්න
4 ශ්‍රේණිය බී
මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

2025 නොවැම්බර් පාසල් නිවාඩුවත් සමඟ මගේ අම්මාගේ ගම වන වැලිමඩ බෝඹුරු ඇල්ල ගම්මානයේ අසිරිය විඳින්න යාමට මා හට දැඩි ආශාවක් ඇතිවුණා.



පසුව මා එම අදහස අම්මාටත් අප්පච්චිටත් කිව්වා. අම්මා අප්පච්චි දෙන්නත් අයියා අක්කාගේ පාසල් නිවාඩුව ලබා දී තිබූ බැවින් හා ගොඩ කාලයකින් අත්තම්මාද බැලීමට නොහැකි වූ නිසා ඒ ගමන යාමට  කැමති වුණා

ඒ අනුව අපි 2025.11.26 වන දින බෝබුරු ඇල්ල ගමට යාමට අප්පච්චිගේ කාරයෙන් පිටත් වුණා.




එදා සාමාන්‍ය දිනයක් බැවින් අපි මේ එන අතරතුර දළදා මාලිගාව,

ගැටඹේ පන්සල වැඳ පුදා ගත්තා




පසුව අපි පේරාදෙණිය මල්වත්තේ සිරි නරඹා පේරාදෙණිය විශ්ව විද්‍යාලය පසු කරමින් වැලිමඩ යාමට පිටත් වුණෙමු.




ඒ යන අතරතුර රම්බොඩ උමඟ පසුකළේ අපි ඉතාමත් සතුටින්. නුවරඑළිය නගරය, ග්‍රෙගරි වැව, සීතාඑළිය කෝවිල, හග්ගල මල්වත්තේ සිරි නරඹමින් ඉදිරියට ආවා.



මා ආශාවෙන් බලා සිටි ඒ සුන්දර දසුන වන බෝඹුරු ඇල්ල දියඇල්ලේ සුන්දරත්වය විඳිමින් අම්මාගේ මල්ලී වන ලසන්ත මාමාගේ ගෙදරට ආවා.



මාමාගේ නිවස පිහිටා තිබුණේද උමා ඔය අසල නිසා මාමාගේ දරුවන් දෙදෙනා වන අභිමාන් අයියා හා සිතුම්ලි නංගී සමඟ උමා ඔයේ සෙල්ලම් කලා. එදා මට ජීවිතේ අමතක නොවන සතුටු දිනයක් විය.



එහෙත් ඒ සතුට වැඩිවේලාවක් තිබුණේ නැත.

ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුවත් සමඟ මම ආසාවෙන් නැරඹූ මෙම ස්ථාන ගංවතුරට සහ නාය යෑම් වලට හසුවී දැඩි ආපදාවට ලක්වී විනාශ වුනා. මගේ මාමාගේ ගෙදරද උමා ඔයේ ජල පහර හේතුවෙන් ගංවතුරට යට වුනා. පෙර දින මා සෙල්ලම් කල උමා ඔය ජල රකුසෙක් බවට පත්වුනා. සොබාදහමට අනුව අපගේ ජීවිත පවා බේරුණේ අප කළ පෙර පිනක් නිසා බවට අම්මා මා සමඟ පැවසුවා.



ගංවතුර සහ නායයෑම් හේතුවෙන් සියලුම පාරවල් අවහිර වී තිබූ බැවින්, අපිට නැවත අපගේ නිවසට ඒමට නොහැකිව දින ගණනාවක් එහි නැවතී සිටීමට සිදු විය.

මුළු ලංකාවම මළගෙයක් මෙන් දුක් විය.. අපි වැලිමඩ යන විට සිරි නරඹමින් ගිය ස්ථාන, නැවත එන විට අප නොසිතූ ආකාරයට වෙනස් වී විනාශ වී ඇති ආකාරය දෑසින් දැක ගැනීමට මට හැකිවුනා.



නැවත කවදා මගේ රට කලින් තිබූ තත්වයට පත්වේද?

ඉතින් සොබා දහම මේ තරම් ඉක්මනින් වෙනස් වුනේ කෙසේදැයි මට තවමත් සිතා ගත නොහැකිය.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN : 978-624-208-954-6